Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School



විෂය:- ශිල්ප කලා

සතිය- 9

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

## පුනරීක්ෂණ අභ්‍යාස

නිපුණතාවය - 05. විසිතුරු අලංකරණ නිර්මාණය

නිපුණතා මට්ටම - 5.1. උත්සව අවස්ථා සඳහා මල් සැකසුම් නිර්මාණය කිරීම.

කාලච්ඡේද - 06

- **දී ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1) ස්වභාවික හා කෘත්‍රිම මල් සැකසුම් කලාව අද ජනප්‍රිය වෘත්තියක් බවට පත්වී ඇත. මනාලියන්ගේ මල් කළඹ සැකසීම සඳහා බහුලවම යොදා ගනු ලබන මල් කාණ්ඩය තෝරන්න.
   1. ඇන්තූරියම්, දාස්පෙතියා, ඉද්ද, රෝස
   2. බෝගන්විලා, ඇන්තූරියම්, කපුරු, ඕකිඩ්
   3. ඕකිඩ්, දාස්පෙතියා, ඉද්ද, කපුරු
   4. රෝස, ලිලී, කපුරු, ඕකිඩ්

2) මල් සැකසුම් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය උපකරණ අතර ස්වභාවික මල් සැකසුමක් රඳවා තබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන්නේ,
   1. ඩ්‍රයිෆෝම්ය ( Dry form )
   2. වෙට් ෆෝම්ය ( Wet form )
   3. රෑජිෆෝම්ය ( Regi form )
   4. පන්ච් ෆෝම්ය ( Punch form )

3) ස්වභාවික මල් සැකසුම් සකස් කිරීමේදී කම්බි කපා ගැනීම සඳහාත්, මල් නටුවෙන් කපාගැනීම සඳහාත් භාවිතා කරන උපකරණ යුගල වන්නේ,
   1. අඬුව, පිහිය
   2. අඬුව, සෙකටියරය
   3. පිහිය, සෙකටියරය
   4. සෙකටියරය, කතුර

4) ස්වභාවික මල් ශාකයෙන් වෙන්කළ පසු ඉක්මණින් වියලීම සිදුවේ. එම නිසා මල් කල්තබා ගැනීම සඳහා ජල බඳුන්වල බහා තබයි. එම ජල බඳුනට මිශ්‍ර කරනු ලබන්නේ,
   1. සබන්, ඇස්ප්‍රින්
   2. පෙනඩෝල්, හාපික්
   3. ඇස්ප්‍රින්, පෙනඩෝල්
   4. හාපික්, සබන්

5) ස්වභාවික මල් සැකසුම් නිර්මාණයේදී නිර්මාණ ශිල්පියා විසින් වඩාත් සැලකිලිමත් විය යුතු සාධක දෙක වන්නේ,
   1. පිරිපුන් බව හා සමබරතාවය
   2. වර්ණය හා හැඩය
   3. සමබරතාවය හා හැඩය
   4. හැඩය හා පිරිපුන් බව

6) මනාලියක් සඳහා මල් කළඹක් නිර්මාණයේදී ශිල්පියා විසින් මනාලිය පිළිබඳ සැලකිය යුතු සාධක කිහිපයක් වෙයි. ඒ අනුව ගලපා මල් කළඹ සැකසිය යුතුය. එම සාධක නම්,

1. උස, මල් කළඹේ බර, මනාලියගේ බර
2. ගැළපෙන වර්ණ, මහත, මල් කළඹේ බර
3. ශරීර ලක්ෂණ, උස, මල් කළඹේ බර
4. ගැළපෙන වර්ණ, ශරීර ලක්ෂණ, මල් කළඹේ බර

7) ස්වභාවික රෝසමල් භාවිතා කර මනාලියක් සඳහා දිගටි හැඩයේ මල් කළඹක් සකස් කිරීම සඳහා අවශ්‍ය රෝස මල් හා පොහොට්ටු ගණන කීයද?

1. මල් 10 පොහොට්ටු 15
2. මල් 15 පොහොට්ටු 10
3. මල් 10 පොහොට්ටු 10
4. මල් 20 පොහොට්ටු 15

8) මනාලියකගේ මල් කළඹ සැකසීමේදී ස්වභාවික මල් කල් තබාගැනීම සඳහා මල් හා කොළ ඉති නටුවල දවටා ගනු ලබන්නේ,

1. තෙත පුළුන් ය. 2. වෙට් ෆෝම්ය 3. ඩ්‍රයි ෆෝම්ය 4. තෙත රෙදිය

9) අමුත්තන් පිළිගැනීම සඳහා මල්මාලා පැළඳවීමට අද සමාජයේ බහුලව දක්නට ඇත. මේ සඳහා බහුලව යොදා ගනු ලබන මල් වර්ගය වන්නේ,

1. රෝස 2. අරලිය 3. ඕකිඩ් 4. කපුරු

10) මල්මාලා සැකසීමේදී ද්‍රවිඩ ජනයා ඒ සඳහා සුවිශේෂී දක්ෂතාවයක් දක්වන අතර, මංගල අවමංගල අවස්ථා සඳහා මල්මාලා භාවිතා කරයි. මේ සඳහා බහුලව යොදා ගනු ලබන මල් වර්ගය කුමක්ද?

1. ඕකිඩ් 2. පිච්ච 3. අරලිය 4. රෝස

11) මෙහි A, B, C, D යනුවෙන් දක්වා ඇත්තේ මල් කළඹක් සැකසීමේ පියවර හතරකි.

A. මල් කළඹේ අග සිට කුඩා මල් සහ කොළ එකතු කර ගැනීම.
B. ක්‍රමයෙන් විශාල වන සේ ලොකු මල් සහ කොළ එකතු කර ගැනීම.
C. කොළ, පොහොට්ටු සහ මල් කෙම් වල කම්බි අමාණ ගම්ටේප් කර ගැනීම.
D. අතින් අල්ලා ගැනීමට හැකි වන සේ කම්බි පහළට නවා ගම්ටේප් කර ගැනීම.

මනාලියක් සඳහා දිගටි හැඩයෙන් යුත් මල් කළඹක් සැකසීමේදී අනුගමනය කළ යුතු අනුපිළිවෙල තෝරන්න.

1. A, B, C, D 2. B, C, A, D 3. C, D, A, B 4. C, A, B, D

12) විවාහ මංගල උත්සවයකදී මනාලියගේ සුන්දරත්වය වැඩි දියුණු කිරීම සඳහා උපයෝගී කර ගන්නා මෙවලමක් ලෙස මල් කළඹට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. සාමාන්‍ය සිරුරක් ඇති මනාලියකට ඉතා සුදුසු වන්නේ,

1. වඩා දිගු මල් කළඹකි.
2. කුඩා ප්‍රමාණයේ මල් කළඹකි.
3. පළල දිගු මල් කළඹකි.
4. තරමක් පළල වඩා දිග නැති මල් කළඹකි.

13) මල් කළඹ නිර්මාණය කිරීමේදී විවිධ හැඩ භාවිතා කරයි. පෝඩි හැඩය යනුවෙන් අදහස් කරනුයේ,

1. රවුම් හැඩයයි.
2. දිගටී හැඩයයි.
3. වී හැඩයයි.
4. අශ්ව ලාඩමක හැඩයයි.

14) ස්වභාවික මෙන්ම කෘත්‍රිම මල් සැකසුම්ද අද ජනප්‍රිය කලාවක් බවට පත්ව ඇත. කෘත්‍රිම මල් සැකසුම් රැඳවා ගැනීම සඳහා භාවිතා කරනු ලබනුයේ,

1. වෙට් ෆෝම්ය
2. සෘජු ෆෝම්ය
3. ඩ්‍රයි ෆෝම්ය
4. කඩදාසි ෆෝම්ය

15) ස්වභාවික මල් භාවිතයේ වාසියක් හා අවාසියක් වන්නේ,

1. ප්‍රවාහනය පහසුවීම හා සුවඳවත් බව
2. හැවුම් බව හා කල්තබාගැනීමේ කාලය සීමිත බව
3. කල් තබාගත හැකිවීම හා සැහැල්ලු බව
4. කිහිපවිටක් භාවිතා කළ හැකි වීම හා සුවඳවත් බව